780

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන 2022/2023

5 වන මට්ටම - අවසාන පරීක්ෂණය.

**EPU5255 - ප්‍රාථමික ඉගැන්වීම සඳහා විද්‍යාව හා පරිසරය**

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2024.02.24 වේලාව - ප.ව.01.30 - ප.ව.3.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## I වන කොටස

01. සිසුන් අතර විද්‍යාත්මක ආකල්ප ඇති කිරීම විද්‍යා අධ්‍යාපනයේ වැදගත් ප්‍රතිඵලයකි. එලෙස සිසුන් තුළ වර්ධනය විය යුතු විද්‍යාත්මක ආකල්ප **පහක් (05)** ලියන්න.

02. සිසුන් තුළ පරිසර ගවේෂණයේ කුතුහලයක් ඇති කිරීමට ගුරුවරයෙකුට භාවිත කළ හැකි ක්‍රියාකාරකම් **දෙකක් (02)** සඳහන් කරන්න.

03. විද්‍යා අධ්‍යාපනයේ ප්‍රතිඵල **තුනක් (03)** ලියන්න.

04. "පරිසර පද්ධතියේ ජෛව සංරචක, පරිසර පද්ධතිය තුළ ඒවායේ ක්‍රියාකාරිත්වය මත පදනම්ව කාණ්ඩ තුනකට වර්ග කළ හැක." ජෛව සංරචක වර්ග **තුනක් (03)** විස්තර කරන්න.

05. " ලීවර යනු සරල යන්ත්‍ර වේ." එක් එක් වර්ගයේ ලීවර සඳහා උදාහරණ උපුටා දක්වමින් ප්‍රාථමික අවධියේ පාසල් දරුවන්ට ඔබ **ලීවර සංකල්පය** උගන්වන ආකාරය පැහැදිලි කරන්න.

06. "ජීවීන්ට සංවේදීතාවයක් ඇති බැවින් ඔවුන් අවට සිදුවන දේ දැනගෙන එම උත්තේජක වලට ප්‍රතිචාර දැක්විය හැකි ය. **ජීවීන්ගේ සංවේදීතාව** ඔබ ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිසුන්ට පැහැදිලි කරන ආකාරය උදාහරණ **දෙකක් (02)** දක්වමින් විස්තර කරන්න.

07. "කාබන් ඩයොක්සයිඩ් ගෝලීය උණුසුම ඇති කරන, හරිතාගාර ආවරණයට දායක වන හරිතාගාර වායු වලින් එකකි." වායුගෝලයේ කාබන් ඩයොක්සයිඩ් සාන්ද්‍රණය වැඩිවීමට තුඩු දෙන මානව ක්‍රියාකාරකම් **හතරක් (04)** සඳහන් කරන්න.

08. විද්‍යාත්මක ක්‍රමයේ ප්‍රධාන පියවර ලියන්න. (8 x 5 = ලකුණු 40)

## 02-කොටස

09. "අප ජීවත් වන්නේ බොහෝ ජීවී සහ අජීවී දේවලින් වට වී ඇති සුවිශේෂී ලෝකයක ය."

   (i.) ජීවීන්ගේ සුවිශේෂී ලක්ෂණ **හයක් (06)** විස්තර කරන්න. (ලකුණු - 06)

   (ii.) "සියලුම ජීවීන් ඔවුන්ගේ ලක්ෂණවල සමානකම් හා වෙනස්කම් අනුව විවිධ කණ්ඩායම් වලට වර්ග කර ඇත." ප්‍රාථමික ශ්‍රේණියේ සිසුන්ට ජීවී වස්තු වර්ගීකරණය ගැන ඉගැන්වීමට ක්‍රියාකාරකමක් සැලසුම් කරන්න. (ලකුණු - 08)

(iii.) ජෛව විවිධත්වය පවත්වා ගැනීමේ වැදගත්කම් **තුනක් (03)** සාකච්ඡා කරන්න.
(ලකුණු - 06)

10. "ජලය සහ රසායනික මූලද්‍රව්‍ය, පරිසර පද්ධති ජෛව හා අජීවී සංරචක හරහා අඛණ්ඩව චක්‍රීයව ගමන් කර කරයි. "

(i.) ජලය එහි භෞතික අවස්ථා 3 අතර වෙනස් වන ආකාරය ප්‍රාථමික සිසුන්ට පැහැදිලි කිරීමට ක්‍රියාකාරකමක් සැලසුම් කරන්න. (ලකුණු - 10)

(ii.) කරුණු **තුනක් (03)** උපුටා දක්වමින් ස්වභාවික චක්‍ර පවත්වාගෙන යාමේදී ශාකවල වැදගත්කම විස්තර කරන්න. (ලකුණු - 06)

(iii.) මානව ක්‍රියාකාරකම් ස්වභාවික චක්‍රවල වෙනස්වීම් ඇති කරන ආකාරය පැහැදිලි කිරීමට හේතු **දෙකක් (02)** දෙන්න. (ලකුණු - 04)

11. "විද්‍යාත්මක කුසලතා සංවර්ධනය විද්‍යා අධ්‍යාපනයේ අභිමත ඉගෙනුම් ඵල වලින් එකකි."

(i.) විද්‍යා අධ්‍යාපනය තුළින් සංවර්ධනය කරගත හැකි කුසලතා **හතරක් (04)** විස්තර කරන්න.
(ලකුණු - 08)

(ii.) "පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්" විෂයයෙන් ඕනෑම මාතෘකාවක් තෝරාගෙන එම මාතෘකාව ඉගැන්වීම තුළින් ප්‍රාථමික සිසුන් අතර, ඉහත සඳහන් කළ කුසලතා **දෙකක් (02)** ඔබ වර්ධනය කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු - 08)

(iii.) විද්‍යා අධ්‍යාපනයේ වැදගත්කම කරුණු **දෙකක් (02)** සඳහන් කරමින් පැහැදිලි කරන්න.
(ලකුණු - 04)

12. "ආහාර දාම සහ ආහාර ජාල භාවිතයෙන් පරිසර පද්ධතියේ බලශක්ති චලනය සාකච්ඡා කළ හැක."

(i.) ආහාර දාමය සහ ආහාර ජාලය යන සංකල්ප දෙකෙහි වෙනස පැහැදිලි කරන්න.
(ලකුණු - 04)

(ii.) ප්‍රාථමික පාසල් දරුවන්ට ආහාර දාමය පිළිබඳ සංකල්පය ඔබ පැහැදිලි කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු - 08)

(iii.) පරිසර පද්ධතියේ වෙනස්කම් ඇති කරන මානව ක්‍රියාකාරකම් **හතරක් (04)** ලියන්න.
(ලකුණු 08)

13. "පෘථිවියේ ජීව ක්‍රියාවලීන්ගේ පැවැත්ම සඳහා ශක්තිය අත්‍යවශ්‍ය වේ."

(i.) එක් එක් වර්ගය සඳහා උදාහරණ දෙකක් උපුටා දක්වමින්, පුළුල් බලශක්ති කාණ්ඩ **දෙකක් (02)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 06)

(ii.) "සූර්යයා බලශක්තියේ මූලික ප්‍රභවයයි." ඔබ මෙයට එකඟ වන්නේද? සාධක 2 ක් ඉදිරිපත්කරමින් ඔබගේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු - 06)

(iii.) කුඩා දරුවන්ගේ එදිනෙදා ජීවිතයේ බලශක්ති භාවිතය සීමා කිරීම සඳහා ඔවුන් තුළ ඇති කළ යුතු පුරුදු **හතරක් (04)** ලියන්න. (ලකුණු - 08)

- හිමිකම් ඇවිරිණි. -